**ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

# රැකියා අවස්ථා

**ISO 9001:2015 ජාත්‍යන්තර තතව සහතිකයෙන් පිදුමලත් ප්‍රධාන පෙළේ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර (03) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය. ඊට අමතරව කළමනාකරණය/අලෙවිකරණය/ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

## 02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තෙත් බිම් කළමනාකරණ) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය / ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය / ඉංජිනේරු සභාව (ලන්ඩන්) / ඉංජිනේරු ආයතනය (ලන්ඩන්) 111 වන අදියරේ විභාගය සමත්වී තිබීම.

සහ

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයෙකු වීම සහ ශ්‍රී ලංකා ඉජිනේරු ආයතනයේ සංස්ථාගත සාමාජිකත්වය හෝ ප්‍රවීන (fellow) සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

මූලික උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර (03) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **HM 1-3 රු. 152,500 - 15 x 4,100 - 214,000/=**

**වයස් සීමාව** :- අවුරුදු 35 ත් - 55 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

## 03. සහකාර සාමාන්‍යාධිකාරී (ජලාපවහන හා ව්‍යුහාත්මක නිර්මාණ) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණවේදී සිවිල් ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය/ ලන්ඩන් ඉංජිනේරු සභාව/ ලන්ඩන් ඉංජිනේරු ආයතනයේ III වන අදියරේ විභාගය සමත්වී තිබීම

**සහ**

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයෙකු වීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සංස්ථාගත සාමාජිකත්වය හෝ ප්‍රවීන (Fellow) සාමාජිකත්වය ලබා තිබීම

**සමඟ**

මූලික උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තම විෂය ක්ෂේත්‍රයට අදාල තනතුරක අවම වශයෙන් වසර පහළොවක් (15) ක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **HM 1-1 රු. 146,640 - 15 x 4,100 - 202,140/=**

**වයස් සීමාව** :- අවුරුදු 35 ත් - 55 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

## 04. කළමනාකරු (සැපයුම්) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (03) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **MM 1-1 රු. 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240/=**

**වයස් සීමාව** :- අවුරුදු 22 ත් - 45 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

## 05. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) 11 ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / තාක්ෂණ ඩිප්ලෝමාව (D.Tech) / ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) /උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE)) හැදෑරීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- **JM 1-1 රු. 72,650 - 10 x 1,360 – 18 x 2,040- 122,970/=**

**වයස් සීමාව** :- අවුරුදු 22 ත් - 45 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව ඉහත වැටුප් තල 2027.01.01 දින සිට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වනු ඇත.

සියලුම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත සඳහන් ලිපිනයට 2026.05.08 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුරෙහි නම අදාල ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි පැහැදිලිව සඳහන් කල යුතුය. අදාල අයදුම්පත්‍රය www.landdevelopment.lk වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයේ නියුතු අය තමන්ගේ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, අයදුම්කරු අදාල තනතුරට තෝරා ගතහොත් එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා අදාල ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**
වෙබ් අඩවිය: www.landdevelopment.lk